# ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනය

## තොරතුරු තාක්ෂණ අංකුරයන් (නව ව්‍යවසායකයන් සවිබල ගන්වන ස්ථාන) - ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාර මධ්‍යස්ථානයක් යාපනයේ ඉදි කිරීම හා පවත්වාගෙන යාම සඳහා උපදේශන සේවා ප්‍රසම්පාදනය

**ප්‍රසම්පාදන අංකය :** HA/F/PRO-RAR/Business Center -Jaffna

ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ උපදේශන ප්‍රසම්පාදන කමිටුව විසින් පහත දැක්වෙන සේවාවන් සම්පාදනය පිණිස සුදුසුකම්ලත් උපදේශකවරුන්ගේ (තනි අයැදුම්කරුවන් ලෙස) අභිලාෂය දැක්වීම අපේක්ෂා කර සිටී.

යාපනයේ තොරතුරු තාක්ෂණ අංකුරයන් (නව ව්‍යවසායකයන් සවිබල ගන්වන ස්ථාන) - ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් (ICT Incubators/Accelerators) සඳහා ව්‍යාපාර මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වූ ක්‍රියාකාරකම්වල සමස්ත අධීක්ෂණය ඇතුළුව සමස්ත ව්‍යාපෘතිය සඳහා උපදේශන සැපයීම, ව්‍යාපාර ආකෘතිය සකස් කිරීම, ඉහළ මට්ටමේ ව්‍යාපෘති කාලසටහන් සැපයීම, මධ්‍යස්ථාන කළමනාකාරිත්වය සඳහා මාර්ග සිතියමක් සැකසීම සහ සමස්ත ව්‍යාපෘති සැලැස්මක් ලබා දී සේවාලාභියාට සහාය වීම.

මේ පිළිබඳ උනන්දුවක් දක්වන තනි උපදේශකවරුන්ගෙන් මීට සමාන උපදේශන කාර්යයන් සිදු කිරීමේ පෙර පළපුරුද්ද, තාක්ෂණික හැකියාවන් සහ යෝග්‍ය ප්‍රවීණත්වය සනාථ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලේඛනමය සාක්ෂි සමග මෙම ඉල්ලීමට ප්‍රතිචාර දක්වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

එසේ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට අදාළ **"යොමුකිරීමේ අනුදේශ** (Terms of Reference)" සහ **"අභිලාෂය ප්‍රකාශ කිරීමේ තොරතුරු පත්‍රිකාව"** (EoI Information Sheet) මෙම අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමට හෝ එම ලේඛන https://www.moha.gov.lk/procurement/ වෙබ් අඩවියෙන් බාගත කර ගැනීමට හැකිය.

ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ නියුක්ත කිරීම සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති ක්‍රියා පටිපාටිවලට අනුකූලව උපදේශකයෙකු තෝරා ගනු ලැබේ.

මේ පිළිබඳ උනන්දුවක් දක්වන උපදේශකයින්ට ගණකාධිකාරී (ප්‍රසම්පාදන),ප්‍රසම්පාදන අංශය, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් 2022.02.03 දින සිට 2022.02.17 දින දක්වා පැය 09.00 සිට පැය 15.00 දක්වා වැඩිදුර තොරතුරු ලබා ගත හැක.

**දුරකතන : +94 112 050 420** [Ext: 1612]

**ෆැක්ස් : +94 112 369 181**

**ඊ-මේල්** : procurement.ha@gmail.com

උනන්දුව ප්‍රකාශ කිරීම පිළිබඳ ඉල්ලුම් පත්‍ර 2022.02.17 දිනට පැය 14.00 ට පෙර පහත සඳහන් ලිපිනයට භාර දිය යුතුය.

**සභාපති,**
**අමාත්‍යාංශ උපදේශන ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රසම්පාදන අංශය බාරේ,**
**ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,**
**16 වන මහල, "නිල මැදුර",**
**ඇල්විටිගල මාවත, නාරාහේන්පිට,කොළඹ 05.**